සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය - රුවන්වැල්ල

අයදුම්පත් කැඳවීම

සීමාසහිත රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුවී ඇති පහත තනතුර සඳහා සමිති අභ්‍යන්තරයෙන් සහ සමිති බල ප්‍රදේශයේ ප්‍රමඛතා අනුපිළිවෙලට කෑගල්ල දිස්ත්‍රික්කයේ වසර දෙකක ස්ථිර පදිංචි, වයස අවුරුදු 18 ත් - 45 ත් අතර (සමුපකාර සමිති සේවකයන්ට සහ සමිති අභ්‍යන්තර සේවකයන්ට වයස් සීමාව බලපානු නොලැබේ) අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2026.11.20 දින දක්වා මා විසින් කැඳවනු ලැබේ.

තනතුර : ක්ෂේත්‍ර නිලධාරී - මෙහෙයුම් 1A ශ්‍රේණිය

වැටුප් ක්‍රමය : රු. 33,500.00 - 10 x 240.00 - 10 x 250.00 - 38,400.00

පන්තිය : III

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සුදුසුකම් :

I. අ.පො.ස. උසස් පෙළ වාණිජ අංශයෙන් සාමාර්ථය ලබා තිබීම

හෝ

II. අ.පො.ස. සාමාන්‍ය පෙළ වාණිජ විෂය සහිතව සමත් වීම සහ සමුපකාර සාමාන්‍ය පෙළ සමත් වීම

හෝ

III. ශාඛා කළමනාකරු හෝ ලිපිකරු තනතුරක වසර 05 කට වැඩි සතුටුදායක සේවා කාලයක් තිබීම

හෝ

IV. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ ජාතික (උසස් පෙළ) සහතිකය ලබා තිබීම හෝ සබරගමුව විශ්වවිද්‍යාලයේ සමුපකාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව උසස් ඩිප්ලෝමාව ලබා තිබීම හෝ පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සැ : යු :

සමිති අභ්‍යන්තර සේවකයන් තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ සමග අදාළ සහතිකවල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව, සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට විවිධ සේවා සමුපකාර සමිතියක සේවය කරන අයෙකු අයදුම්කරන්නේ නම් එම සමිතියේ මෑතකදී ලබාගත් සේවා සහතිකයේ පිටපතක් සහ ඉල්ලුම් කරන තනතුරට ඔබව තෝරාගත හොත් දැනට සේවය කරනු ලබන සමිතියෙන් නිදහස් කරන බවට සමිතියෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත සමිතියේ සභාපති තුමා මගින් නිර්දේශ කර එවිය යුතුය.

පිරිමි අයෙකු සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

යතුරු පැදි ධාවනය සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් අවශ්‍ය වේ.

මනා දක්ෂ කාර්යශූර, සෞඛ්‍ය සම්පන්න අයෙකු විය යුතුය.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාම සේවා සහතිකය, චරිත සහතික දෙකක්, හැඳුනුම්පත, පළපුරුද්ද පිළිබඳ සහතිකය, සේවා සහතික හා වෙනත් සුදුසුකම් සහතිකවල ඡායා පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය.

"ගරු සභාපති, සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය, රුවන්වැල්ල."

ගරු සභාපති,
සී/ස රුවන්වැල්ල වි.සේ.ස. සමිතිය, රුවන්වැල්ල.
036-2266392 / 036-2266345
2026.11.06